

* ධර්මප්‍රිය ඩයස් අවුරුදු අටේදී ශ්‍රීපති දහම් පාසලේ නාට්‍යයක දොරටු පාලකයකු ලෙසින්.



* ධර්මප්‍රිය ශිෂ්‍ය භටයකු ලෙසින් රන්ටැඹේ පුහුණු කඳවුරේදී සාජන් තිලංක හා දේවින් සමඟ.



* ධර්මප්‍රිය 2003 වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ දී හොඳම නළුවා ලෙසින් සම්මානයට පාත්‍ර වී.



* ධර්මප්‍රිය ඩයස් ප්‍රිය බිරිය අනෝජා සමඟ යුග දිවි ඇරඹී දා.



* 95' දී ප්‍රේමකුමාර කරුණාරත්න ගේ බිංදුව වේදිකා නාට්‍යයේ ධර්මප්‍රිය රංගනයේ නියැලෙමින්.



* සිහින හොරු අරං නාට්‍ය කණ්ඩායම සමඟ ප්‍රංශයේ සංචාරයකදී.



* ධර්මප්‍රිය පුතු ස්වර්ණ රාවණ සමඟ සුරතල් වූ මොහොතක්.

වේදිකා නාට්‍ය නිෂ්පාදකයකු, අධ්‍යක්ෂවරයකු, පසුතල නිර්මාණකරුවකු මෙන්ම වේදිකාවේත්, සිනමාවේත්, පුංචි තිරයේත් ජනප්‍රිය නළුවකු වන ධර්මප්‍රිය ඩයස්, බන්දුල විතානගේ ගේ රෝමය ගිනි ගනී නාට්‍යයේ සහය වේදිකා පරිපාලකයකු ලෙසින් මුල් වරට වේදිකාවට අවතීර්ණ වූයේය. කේ. බී. හේරත්ගේ දෙවැනි මනින්ද නාට්‍යයෙන් වේදිකා නාට්‍ය රංගනයට අවතීර්ණ වූ ධර්මප්‍රිය වාසුදේව, කනේරු මල්, සිහින සාප්පුව, වැනිසියේ වෙළෙන්දා, වීරයා මැරිලා, අරුන්දතී, අසිනමාලී, හසිනා, සූකරයෙක් සමඟ, දස මල්ලිගේ බංගලාව ආදී වේදිකා නාට්‍ය රැසකට සිය රංග ප්‍රතිභාව දායාද කළේය. 95' දී බිංදුව, 96' දී පොපර් මාමා සහ පිංතූරය කෝට් නාට්‍ය නිෂ්පාදනය කොට රාජ්‍ය නාට්‍ය උළෙලේ අවසන් වටය නියෝජනය කළ ධර්මප්‍රිය, ලයිසිස් ට්‍රාටා වේදිකා නාට්‍ය නිෂ්පාදනය කරමින් වේදිකා නාට්‍ය අධ්‍යක්ෂණයට අවතීර්ණ විය.

2003 වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ දී හසිනා නාට්‍යයේ රංගනය උදෙසා හොඳම නළුවා ලෙසින් සම්මානයට පාත්‍ර වූ ධර්මප්‍රිය 2004 දී දස මල්ලිගේ බංගලාව නාට්‍යයේ හොඳම පසුතල නිර්මාණය වෙනුවෙන් ද 2005 වසරේ ලයිසිස් ට්‍රාටා නාට්‍යයේ හොඳම රංග වින්‍යාසය වෙනුවෙන් ද රාජ්‍ය සම්මානයට පාත්‍ර විය. අරුන්දතී, වීරයා මැරිලා, සූකරයෙක් සමඟ ආදී නාට්‍ය රැසක හොඳම සහය නළුවා ලෙසින් නිර්දේශයන්ට පාත්‍ර වූ ධර්මප්‍රිය සඳමඩල නාට්‍යයෙන් සහය නළුවා ලෙසින් රාජ්‍ය සම්මානයට ද පාත්‍ර වූයේය. ටෙලි නාට්‍ය රැසකට ද රංගනයෙන් දායක වී ඇති ධර්මප්‍රිය නිසිංහ විරෝත වෙරානි, වලාපටල, බොරදිය පොකුණ, මවං චිත්‍රපට සඳහා රංගනයෙන් දායක වී ඇති අතර 2008 වසරේ සරසවිය සම්මාන උළෙලේ දී මවං චිත්‍රපටයේ රංගනය උදෙසා හොඳම නළුවා ලෙසින් සම්මානයට පාත්‍රවීමේ භාග්‍යයද ධර්මප්‍රියට උදා විය. දෙහිවල ශාස්ත්‍රානන්ද විද්‍යාලයේ චිත්‍ර හා නාට්‍ය රංග කලාව පිළිබඳ ආචාර්යවරයකු ලෙසින් කටයුතු කරන ධර්මප්‍රිය පිළියන්දල මධ්‍ය මහා විද්‍යාලයේ ආදි සිසුවකු වන අතර විද්‍යාලයේ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ආචාර්යවරයකු වූ ප්‍රේමකුමාර කරුණාරත්න ගුරුතුමන්ගේ මඟ පෙන්වීමෙන් කලා ක්ෂේත්‍රයට අවතීර්ණ වූයේය.

සටහන - **චන්දන**

# MY ALBUM



බිරිය අනෝජා පුතු ස්වර්ණ සමඟ විනෝද සංචාරයකදී.



* විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේදී ධර්මප්‍රිය ක්‍රීඩා නායක ලෙසින් ඔලිම්පික් පහන දැල් වූ මොහොත.



* ධර්මප්‍රිය ජර්මනියේ සංචාරයකදී දයාදේව එදිරිසිංහ සමඟ.



* ගමේ යහළුවන් සමඟ වෙසක් ඉසා දෙන කිරි කෝපි දන්සලේදී.



* 2004 දී බර්ලින් නුවර සංචාරයකදී බ්‍රෙෂ්ට් තියටර් ඉදිරිපිටදී.



ධර්මප්‍රිය ප්‍රංශයේ සංචාරයකදී සුපු පල්ලිය ඉදිරිපිටදී.